www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# එක්සත් ජාතීන්ගේ සංවිධානය ශ්‍රී ලංකාව තුල මානව හිමිකම් පිලිබඳ සීමිත විමසුමක් අරඹයි

## UN sets up limited inquiry into human rights in Sri Lanka

**කේ. රත්නායක විසිනි**

**2010 ජූනි 28**

එක්සත් ජාතීන්ගේ මහ ලේකම් බැන් කි-මූන් ජූනි 22 දා දිවයිනේ සිවිල් යුද්ධයේ අවසන් අදියර තුල මානව හිමිකම් උල්ලංඝනය පිලිබඳව තමන්ට උපදෙස් දෙනු පිනිස විශේෂඥයන්ගේ මන්ඩලයක් නම් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ආන්ඩුව කෝපාවිෂ්ට ප්‍රතිචාරයක් දක්වා තිබේ. 2009 මැයි මස සිදු වූ බෙදුම්වාදී දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයේ පරාජයට පෙරාතු මාස කිහිපය තුල දී ශ්‍රී ලංකාවේ මිලිටරිය එල්ල කල අනවරත ප්‍රහාර මගින් සිවිල් වැසියන් දහස් ගනනක් ඝාතනය කෙරුනි.

එක්සත් ජාතීන්ගේ එම උපදේශක මන්ඩලයේ නායකත්වය දරන්නේ ඉන්දුනීසියාවේ සුහර්තෝ මිලිටරි ආඥාදායකත්වය සමයේ පාලක පක්ෂය වූ ගොල්කාර් සංවිධානයේ සාමාජිකයකු වන, එරට හිටපු නීතිපති මර්සුකී දරුස්මාන් ය. සෙසු සාමාජිකයන් නම් දකුනු අප්‍රිකාවේ සත්‍යය හා සංහිඳියාව පිලිබඳ කොමිසමේ හිටපු සාමාජිකයකු වූ යස්මින් සූකා සහ ඇමරිකානු නීති මහාචාර්යවරයකු වන ස්ටීවන් රැට්නර් ය. එක්සත් ජාතීන්ගේ ප්‍රකාශක මාටින් නෙසිර්කි, "උපදේශක මන්ඩලය මහ ලේකම්ට උපදෙස් දීමට සීමා වන අතර . . . එය කරුනු සෙවීමේ හෝ පරීක්ෂක මන්ඩලයක් නොවන" බව සටහන් කරමින්, මෙම පියවරේ සීමිත පරිමාව අවධාරනය කලේය.

ශ්‍රී ලංකාවේ ජනාධිපති මහින්ද රාජපක්ෂ පසු දින කැබිනට් රැස්වීමක දී එම එක්සත් ජාතීන්ගේ මන්ඩලය ප්‍රතික්ෂේප කලේය. විදේශ ඇමති ජී.එල්. පීරිස් මෙසේ ප්‍රකාශ කලේයඃ "අපට හැඟී යන්නේ එම මන්ඩලය අනවශ්‍ය ඇඟිලිගැසීමක් බවයි. ස්වකීය පරීක්ෂන පැවැත්වීමේ නිදහස ආන්ඩුවට දිය යුතුයි." තමන් එක්සත් ජාතීන්ගේ මන්ඩලය සමග සහයෝගීව කටයුතු කරන්නේ වත් එහි සාමාජිකයන්ට රටට ඇතුලුවීමට වීසා ලබාදෙන්නේ වත් නැති බව ආන්ඩුව නිවේදනය කර තිබේ.

එක්සත් ජාතීන්ගේ මන්ඩලය නිවේදනය කෙරුනු දින ම, යුරෝපා සංගමය කොලඹ ආන්ඩුවට අවසන් නිවේදනයක් නිකුත් කරමින් ප්‍රකාශ කර සිටියේ, මානව හිමිකම් ආරක්ෂා කිරීම ගැන ලිඛිත සහතිකයක් නැතිව තමන් අගෝස්තු 15 දායින් පසුව ශ්‍රී ලංකාවට ජීඑස්පී ප්ලස් තීරු බදු සහන තව දුරටත් දීර්ඝ නොකරන බවයි. ජුලි මාසයෙන් පටන් ගෙන මාස හයක කාල සීමාවක් තුල මානව හිමිකම් සම්බන්ධිත ක්‍රියාමාර්ග ගනනාවක් ගන්නා බවට "පැහැදිලි හා ලිඛිත පොරොන්දුවකට යටත්ව, සීමිත අමතර කාල පරිච්ඡේදයකට" එම සහනය දීර්ඝ කරන බවට යුරෝපා සංගමයේ නිවේදනය යෝජනා කලේය. යුරෝපා සංගමයේ සහනය ඉවත් කර ගැනීම යුරෝපයට යන ශ්‍රී ලංකාවේ අපනයන මත, විශේෂයෙන් ම ඇඟලුම් මත, බලපානු ඇත.

ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාවේ 17 වන සංශෝධනය ක්‍රියාත්මක කිරීම, නඩු විභාග නොමැතිව රඳවා ගැනීමට ඉඩ සලසන හදිසි නීති රෙගුලාසි ඉවත් කිරීම, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මන්ඩල සමග සහයෝගීව ක්‍රියා කිරීම, හිටපු එල්ටීටීඊ සටන්කරුවන් හා රැඳවුම් භාරයේ සිටින සෙසු පුද්ගලයන්ගේ නම් හෙලිදරව් කිරීම සහ මාධ්‍යවේදීන්ට එරෙහි හිරිහැර නතර කිරීම ඇතුලු අංශ 15ක් යුරෝපා සංගමය නම් කර තිබේ.

ආන්ඩුව මෙම කොන්දේසි එකහෙලා ප්‍රතික්ෂේප කලේය. පීරිස් මෙසේ ප්‍රකාශ කලේයඃ "තීරන ගැනීමේ බලතල, ඉතා සංවේදී හා තීරනාත්මක කාරනා මොන යම් හෝ විදේශ ආන්ඩුවකට යටත් කරන්න අපට බැහැ." විශේෂයෙන් ම ඔහු මෙසේ අවධාරනය කලේයඃ "17 වන ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක කිරීම අභ්‍යන්තර කාරනයක්."

ආන්ඩුවේ තනතුරුවලට කෙරෙන පත් කිරීම් අධීක්ෂනය කිරීමේ ද පොලීසිය, මැතිවරන හා රාජ්‍ය සේවා ඇතුලු ආන්ඩුවේ ප්‍රධාන ආයතන අධීක්ෂනය කරන සෙසු කොමිසම් පත් කිරීමේ ද පුලුල් බලතල සහිත ව්‍යවස්ථාදායක මන්ඩලයක් පත් කිරීම 17 වන ව්‍යවස්ථා සංශෝධනයට ඇතුලු වේ. රාජපක්ෂ ආන්ඩුව, සිය ඥාතිමිත්‍ර ජාලයේ බලතල කප්පාදු කරනු

ඇති මෙම ව්‍යවස්ථාමය අවශ්‍යතා නොතකා හැර ඇති අතර එය ව්‍යවස්ථාවෙන් ඉවත් කිරීම එහි අභිප්‍රාය ලෙස පවතී.

ජනාධිපතිගේ සොහොයුරු වන ආර්ථික සංවර්ධන ඇමති බැසිල් රාජපක්ෂ පසුගිය සති අන්තයේ *සන්ඩේ ටයිම්ස්* පත්‍රයට මෙසේ පැවසීයඃ "මෙය අතීතයේ යටත් විජිත පාලකයන් අපට සැලකූ ආකාරයට වඩා ආඥාදායකයි. අපිව බය කරලා යටත් කර ගන්න බැහැ. අපට පුලුවන් අපේ දෙපයින් නැගී ඉඳලා මෙම කොන්දේසිවලට ප්‍රතිරෝධය දක්වන්න." ඔහුගේ අදහස් දැක්වීම්, රටට එරෙහි "ජාත්‍යන්තර කුමන්ත්‍රනයක්" පිලිබඳව පාලක සභාගය කලින් කල මවාපෑම් සමග එක පෙලට යයි.

මිලිටරියේ යුද අපරාධ සම්බන්ධයෙන් ඍජුවම වගකිව යුතු ආන්ඩුව, සිය ක්‍රියාවන් සම්බන්ධ මොන යම් හෝ ජාත්‍යන්තර පරීක්ෂනයක්, එවන් පරීක්ෂනයක් කෙතරම් සීමිත වුවත්, වලකාලීමට මංමුලා සහගතව ක්‍රියා කරයි. එල්ල වන විවේචන අපසරනය කිරීමේ ප්‍රයත්නයක් ලෙස, ජනාධිපති රාජපක්ෂ අර්බුද අධ්‍යයනය හා සංහිඳියාව පිලිබඳ කොමිසමක් පිහිටුවා තිබේ. මීට පෙර පැවති කොමිෂන් හා පරීක්ෂන මෙන් ම, එය ද ආන්ඩුවේ වාර්තාවට සුදු හුනු ගානු ඇත.

ජනවාරි 20 සහ මැයි 14 අතර, යුද්ධයේ අවසන් මාස ගනනාව තුල දී සිවිල් වැසියන් අඩු ගනනේ 7,000ක් මිය ගිය බවට එක්සත් ජාතීන්ගේ සංවිධානය තක්සේරු කර තිබේ. ජාත්‍යන්තර අර්බුද කන්ඩායම පසුගිය මාසයේ නිකුත් කල වාර්තාවක් එම සංඛ්‍යාව ඊට වඩා ඉහල තැනක, එනම් 30,000 හා 75,000 අතර මරන සංඛ්‍යාවක් ලෙස, තැබූ අතර එල්ටීටීඊ-පාලිත ප්‍රදේශ තුල රෝහල් හා සිවිල් වැසියන් හිතාමතා ඉලක්ක කල බවට එය ශ්‍රී ලංකා මිලිටරියට චෝදනා ද කලේය. එක්සත් ජනපදයේ පාදක හියුමන් රයිට්ස් වොච් සංවිධානය සහ බ්‍රිතාන්‍යයේ චැනල් 4 නාලිකාව දෙමල වැසියන් වධබන්ධනයට ලක් කල අයුරු පෙන්වන ඡායාරූප ඉදිරිපත් කල අතර විශේෂඥයන් ඒවා සැබෑ ඒවා බව පවසා ඇත. කොලඹ ආන්ඩුව එවන් සියලු සාක්ෂ්‍ය "ගෙතූ" ඒවා බවට නැවත නැවතත් හංවඩු ගසා ඇති අතර හමුදාව එකදු සිවිල් වැසියකු වත් ඝාතනය නොකල බව ද කියාපෑවේය.

එල්ටීටීඊයේ පරාජයෙන් පසුව, හමුදාව 250,000කට අධික සිවිල් වැසියන් පිරිසක් "මිනිසුන්, ගැහැනුන් හා ලමුන්" දැවැන්ත මිලිටරිය විසින් පාලනය කෙරෙන රැඳවුම් මධ්‍යස්ථානවලට ගාල් කලේ රටේ ව්‍යවස්ථාව යටතේ පවතින ඔවුන්ගේ මූලික අයිතීන් පවා විවෘතව උල්ලංඝනය කරමිනි. ඔවුන් අතර සිටි තරුනයෝ විශේෂයෙන්ම ප්‍රශ්න කිරීම්වලට ලක් කෙරුනි. "ත්‍රස්තවාදී සැකකරුවන්" ලෙස චෝදනා කෙරුනු දහස් ගනනක් නොදන්නා ස්ථානවල පිහිටි පුනරුත්ථාපන මධ්‍යස්ථානවලට ඇද ගෙන යනු ලැබුනි. යුද්ධය අවසන් වීමෙන් වසරකට පසුවත් තවමත් බල පවත්වන රටේ හදිසි නීතිය නඩු විභාග නොමැතිව දින නියමයක් නැතිව පුද්ගලයන් රඳවා ගැනීමට ඉඩ සලසයි.

එක්සත් ජාතීන්ගේ උපදේශක මන්ඩලය පිහිටුවීම වලකාලීමේ ප්‍රයත්නයක රාජපක්ෂ ආන්ඩුව යෙදී තිබේ. මේ මස මුලදී එක්සත් ජනපදයට කල සංචාරයක දී පීරිස් එක්සත් ජනපද රාජ්‍ය ලේකම් හිලරි ක්ලින්ටන් හමුවූ අතර ඇය කොලඹ ආන්ඩුවේ ප්‍රෝඩාකාරී අර්බුද අධ්‍යයනය හා සංහිඳියාව පිලිබඳ කොමිසමට සහයෝගය දුන්නාය. එමෙන්ම, එක්සත් ජාතීන්ගේ සංවිධානය සමග වැඩ කරන ලෙස ශ්‍රී ලංකා ආන්ඩුවෙන් ඉල්ලා සිටි ඔබාමා පාලනාධිකාරය, පසුගිය සතියේ දී එක්සත් ජාතීන්ගේ උපදේශක මන්ඩලය පිහිටුවීම සාදරයෙන් පිලිගත්තේය.

රාජපක්ෂගේ යුද්ධයට සහයෝගය දුන් එක්සත් ජනපදය සහ යුරෝපා සංගමය යන දෙගොල්ලම මානව හිමිකම් පිලිබඳ කාරනය යොදාගන්නේ කොලඹ මත චීනයේ වැඩෙන ආනුභාවයට වලකැපීමේ විධික්‍රමයක් ලෙසය. යුද්ධය තුල දී රාජපක්ෂ රාජ්‍යතාන්ත්‍රික, මූල්‍ය හා මිලිටරි සහයෝගය සඳහා බෙයිජිං මත වඩවඩාත් වාරු විය. එය දුන් සහයෝගයට හිලව් වසයෙන්, චීනයට සැලකිය යුතු ආර්ථික සහන ලැබී තිබේ.

පසුගිය සතියේ දී, ශ්‍රී ලංකා ආන්ඩුව දකුනේ හම්බන්තොට නගරයේ නවීන නව වරායක් ඉදිකිරීමේ ව්‍යාපෘතියේ දෙවන අදියර වර්ධනය කිරීමේ ඩොලර් මිලියන 250ක ගිවිසුමක් චීනය සමග අත්සන් කලේය. මෙම මාසය තුල දී ම ඊට පෙර හම්බන්තොට අසල ජාත්‍යන්තර ගුවන් තොටුපලක් සඳහා මුදල් යෙදීම හා එය ඉදිකිරීම සඳහා ගිවිසුමකට එලඹුනි. චීනය සම්බන්ධයෙන් ගත් කල, එය වනාහි, තීරනාත්මක බල ශක්ති හා සෙසු සම්පත් සපයන, මැද පෙරදිග හා අප්‍රිකාවේ සිට එන ප්‍රධාන මුහුදු මාර්ග ආරක්ෂා කරගැනීමේ වඩා පුලුල් මූලෝපායක කොටසකි.

එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මන්ඩලයට හෝ මහා මන්ඩලයට යොමු කිරීමකින් තොරව මහ ලේකම් බැන් විසින් පිහිටුවන ලද එක්සත් ජාතීන්ගේ උපදේශක මන්ඩලය ව්‍යර්ථ කිරීම පිනිස රාජ්‍යතාන්ත්‍රික සහයෝගය ලබාගැනීමේ තැතක ශ්‍රී ලංකාව යෙදී සිටී. රුසියානු විදේශ අමාත්‍යංශය එවන් විරුද්ධත්වයක් ඇඟවුම් කරමින් මෙසේ සඳහන් කර ඇතඃ "අපේ උත්සුකතාවට හේතු වූ තවත් කරුනක් වන්නේ, මෙම තීන්දුව ගෙන ඇත්තේ ස්වෛරී රාජ්‍යයක් හා එක්සත් ජාතීන්ගේ සාමාජිකයකු ලෙස ශ්‍රී ලංකාවේ තත්වය ගැන සැලකීමකින් තොරව වීමයි." චීනය හා නොබැඳි

ජාතීන්ගේ ව්‍යාපාරය ද එය පිලිබඳ නොඑකඟතා පල කර ඇතැයි ශ්‍රී ලංකාවේ විදේශ අමාත්‍යාංශය කියාපායි. මාර්තුවේ දී නොබැඳි ජාතීන්ගේ ව්‍යාපාරය එක්සත් ජාතීන්ගේ උපදේශක මන්ඩලයට විරුද්ධව නිවේදනයක් නිකුත් කල නමුත්, එය පිහිටුවීමෙන් පසුව මේ දක්වා කිසිදු අදහස් දැක්වීමක් කර නැත.

ශ්‍රී ලංකාව තුල, යුද්ධයට සහයෝගය දුන් ප්‍රධාන විරුද්ධ පක්ෂ, මෙම කාරනාවේ දී ආන්ඩුව පිටුපස පෙලගැසී ඇත. එක්සත් ජාතික පක්ෂය නිල නිවේදනයක් නිකුත් කර නැති මුත්, එහි මන්ත්‍රීවරු පුද්ගලිකව එක්සත් ජාතීන්ගේ උපදේශක මන්ඩලයට විරුද්ධත්වය ප්‍රකාශ කරමින්, යුද්ධය තුල දී මානව හිමිකම් ආරක්ෂා කිරීම කල නොහැකි යයි පවසා ඇත. ජනතා විමුක්ති පෙරමුනේ (ජවිපෙ) ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා ද ඊට සමාන ප්‍රකාශයක් සිදු කර තිබේ. යුද්ධය තුල දී, ජවිපෙ සිවිල් වැසියන්ට එරෙහි මිලිටරියේ ප්‍රහාර, ආන්ඩුවට ගැති ඝාතක කල්ලි විසින් සිදු කෙරුනු "අතුරුදහන්කිරීම්" සහ මාධ්‍ය මත නැවතනැවතත් එල්ල කෙරුනු ප්‍රහාර උද්යෝගිමත්ව ආරක්ෂා කලේය.

මොන යම් හෝ විරුද්ධත්වයක් නැතිකම මගින් අවධාරනය කෙරෙන්නේ, මූලික ප්‍රජාතන්ත්‍ර අයිතීන් ආරක්ෂා කිරීම සඳහා කොලඹ දේශපාලන සංස්ථාපිතය තුල කිසිදු සහයෝගී පදනමක් නොමැති බවයි. එක්සත් ජාතීන්ගේ උපදේශක මන්ඩලය මිලිටරියේ යුද අපරාධවලට ගොදුරු වූවන්ට කිසිදු යුක්තියක් ඉටු කිරීමක් ද නොකරනු ඇත. මුල පටන්ම එහි වපසරිය සීමා කෙරී ඇති මෙම මන්ඩලය වනාහි, කොලඹ මත සිය ආනුභාවය සඳහා තරග වදින මහ බලවතුන්ගේ හුදු සෙල්ලමක් පමනි.

© www.wsws.org